**ශීර්ෂය 120 - කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශය පිළිබඳ විගණකාධිපති වාර්තාව 2015 වර්ෂය**

---------------------------------------------------------------------------------------------------

ශීර්ෂය 120 - කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශයේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

**1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ වගකීම**

------------------------------------------------------------------------------------------

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙනයාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**2. ගිණුම්**

--------

**2.1 විසර්ජන ගිණුම**

------------------

**මුළු ප්‍රතිපාදනය හා වියදම**

----------------------------

අමාත්‍යාංශය සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 5,044.39 ක්වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 4,157.86 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව අමාත්‍යාංශය වෙත සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.මිලියන 886.53 ක් හෙවත් සියයට 17.57 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| **වියදම** | **2015 දෙසැම්බර් 31 දිනට** | | | **ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස** |
|---|---|---|---|---|
| | **ශුද්ධ ප්‍රතිපාදනය** | **උපයෝජනය** | **ඉතිරිය** | |
| | **රු.මිලියන** | **රු.මිලියන** | **රු.මිලියන** | |
| පුනරාවර්තන | 4,379.69 | 3,717.62 | 662.07 | 15.12 |
| මූලධන | 664.70 | 440.24 | 224.46 | 33.77 |
| **එකතුව** | **5,044.39** | **4,157.86** | **886.53** | **17.57** |

**2.2 අත්තිකාරම් ගිණුම**

**2.2.1 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම**

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

අමාත්‍යාංශයට අදාළ විෂය අංක 12001 යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| **උපරිම සීමාව** | **තථ්‍ය** | **අවම සීමාව** | **තථ්‍ය** | **උපරිම සීමාව** | **තථ්‍ය** |
| රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 40.00 | 25.70 | 17.00 | 19.71 | 85.00 | 63.81 |

**2.3 විගණන නිරීක්ෂණය**

කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශයේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ඉහත 1.1 ඡේදයේ දක්වා ඇති කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. විගණන නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් නිරීක්ෂණ 3 ඡේදයේ සඳහන් කර ඇත.

**3. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ**

**3.1 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

අමාත්‍යාංශය විසින් පහත දැක්වෙන ලේඛනයක් පවත්වා නොතිබුණු අතර, තවත් ලේඛනයක් විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බැව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| | **ලේඛන වර්ගය** | **අදාළ රෙගුලාසිය** | **නිරීක්ෂණ** |
|---|---|---|---|
| (i) | හානි පිළිබඳ ලේඛනය | මුදල් රෙගුලාසි 110 | යාවත්කාලීන කර නොතිබුණි |
| (ii) | බැරකම් ලේඛනය | මුදල් රෙගුලාසි 214 | පවත්වා නොතිබුණි. |

3.2 විසර්ජන ගිණුම

------------------

3.2.1 අයවැය විචලනය

---------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වැය විෂයයන් 12 ක් සඳහා සලසා තිබුණු රු.174,772,190 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයම ඉතිරිවී තිබුණි.

(ආ) වැය විෂයයන් 16 ක ට අධි ප්‍රතිපාදන සලසා තිබීම නිසා ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 50 ක සිට සියයට 90 ක් දක්වා පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

3.3 අග්‍රිම ගිණුම්

---------------

2015 ජුලි 14 දිනැති අංක 03/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයෙන් සංශෝධිත මුදල් රෙගුලාසි 371(5) ප්‍රකාරව කාර්යය නිමකර දින 10 ක් ඇතුළත ලබාගත් තත්කාර්ය අතුරු අග්‍රිමය නිරවුල් කළ යුතු වුවත්, අවස්ථා 71 කදී ලබාදුන් එකතුව රු.1,169,771 ක් වූ තත්කාර්ය අතුරු අග්‍රිමයන් පියවීම සඳහා, කාර්යයන් නිම වී මාස 01 ක සිට මාස 09 ක් දක්වා කාල පරාසයක් ගෙන තිබුණි.

3.4 යහපාලනය හා ගිණුම් කටයුතුභාවය

-----------------------------------------

3.4.1 වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම

---------------------------------

රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුව කටයුතු කර භාණ්ඩ හා සේවා ලබා ගැනීම සඳහා අයවැය ඇස්තමේන්තුවෙන් රු. මිලියන 305 ක ප්‍රතිපාදන සලසා තිබුණි. එම ප්‍රතිපාදන උපයෝජනය කිරීම සඳහා 2006 මාර්තු 24 දිනැති අංක 128 දරන ජාතික අයවැය චක්‍රලේඛයේ ඡේදය ප්‍රකාරව මිලදී ගැනීම් සිදුකරනු ලබන කාල වකවානු අනුව සවිස්තරාත්මකව පිළියෙළ කළ ප්‍රසම්පාදන කාලසටහනක් නොවූ අතර ප්‍රසම්පාදන සැලැස්මෙහි වර්ෂය පුරා අවශ්‍යතාවය පරිදි මිලදී ගැනීම් සිදුකරන බව දක්වා තිබුණි. එසේ වුවද, අමාත්‍යාංශය සමාලෝචිත වර්ෂයේ සිදුකළ මිලදී ගැනීම්වලින් රු.9,660,471 ක මිලදී ගැනීම් නොවැම්බර් හා දෙසැම්බර් මාස දෙක තුළදී සිදුකර තිබුණි.

3.4.2 අභ්‍යන්තර විගණනය

-------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන විෂය පථයට ළමා කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය, පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව, ළමා සංවර්ධන අරමුදල, ළමා ලේකම් කාර්යාලය, කාන්තා කාර්යාංශය, කාන්තා කමිටුව, යන කාර්යාල විගණනයට යටත් කර තිබුණද, මෙහි කාර්යභාරයන් ඉටු කිරීම සඳහා ප්‍රධාන අභ්‍යන්තර විගණක සමඟ සිව් දෙනෙකුගෙන් යුත් කාර්යය මණ්ඩලයක් පමණක් යොදවා තිබුණි. ප්‍රධාන අභ්‍යන්තර විගණක හැර අනිකුත් නිලධාරීන් තිදෙනා විගණන කටයුතු ඉටුකිරීම සඳහා ප්‍රමාණවත් සුදුසුකම් ලබා නොතිබුණි.

(ආ) ආයතනයේ පැවැත්මට බලපාන්නා වූ නීතිමය රාමුව තුළ කාර්යක්ෂම අභ්‍යන්තර පාලන ව්‍යුවහයක් ස්ථාපිත කර ගැනීමටත් අරමුණුගතව සමස්ථ කාර්යයේම කාර්යසාධනයක් ඇති කර

ගැනීම කළමනාකරණයේ ප්‍රධාන වගකීම වන අතර ඒ සඳහා සහයවීමට අවශ්‍ය ක්‍රමවේදයක් සකස් කර එම කාර්යභාරය අභ්‍යන්තර විගණනයට පැවරීම කළ යුතු වුවත් කළමනාකරණය විසින් ඒ පිළිබඳ අවධානය යොමුකර නොතිබුණි.

(ඇ) 2009 ජුනි 09 දිනැති අංක DMA/2009(1) දරන කළමනාකරණ විගණන චක්‍රලේඛයෙහි 7 ඡේදයට අනුව අමාත්‍යාංශයේ හා ඒ යටතේ ඇති ආයතන 06යෙහි සියළුම පාලන හා පද්ධතීන් ආවරණය වන පරිදි අභ්‍යන්තර විගණන සැලැස්ම පිළියෙළ කළ යුතුව තිබුණි. වඩාත් අවදානම් සහිත අංශ ආවරණය වන පරිදි සැලැසුම් පිළියෙළ කර තිබුණත්, අභ්‍යන්තර විගණන සැලැස්මේ සඳහන් කර තිබූ රු.මිලියන 73.59 ක ප්‍රතිපාදන සලසා තිබුණු ප්‍රධාන අයිතමයන් 07 ක් සම්බන්ධයෙන් ප්‍රමාණවත් විගණනයන් සිදු කර නොතිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේදී අභ්‍යන්තර විගණන අංශය විගණන වාර්තා 22 ක් නිකුත් කර තිබුණි. ඉන් 13කට පමණක් කළමනාකරණය විසින් පිළිතුරු ඉදිරිපත් කර තිබුණි. වාර්තා 9 කින් පෙන්වාදී තිබූ කරුණු කෙරෙහි කළමනාකරණයේ අවධානය යොමු කර නොතිබුණි. පිළිතුරු ලබාදී තිබෙන විගණන වාර්තාවලින් පෙන්වා දුන් අඩු පාඩු නිවැරදි කර ගැනීමට සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් කටයුතු කර නොතිබුණි.

**3.4.3 වාර්ෂික කාර්යසාධන වාර්තාව**

--------------------------------

2002 සැප්තැම්බර් 12 දිනැති අංක 402 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් මුදල් වර්ෂය අවසාන වී දින 150 ක් ඇතුළත කාර්යසාධන වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු වුවත්, එම වාර්තාව 2016 අගෝස්තු 31 දින වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

**3.5 අනුකූල නොවීම්**

-----------------

**නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

----------------------------------------------

2004 මැයි 12 දිනැති අංක 04/0427/020/002 දරන අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව අනුව සියලුම අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු ඇතුළු රජයට අයත් ආයතන වල සියලු විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍ය කර්තව්‍යන් රාජ්‍ය මාධ්‍ය ආයතන මඟින් ඉටුකරවා ගත යුතු වුවත්, පෝෂණ මල්ල වැඩසටහන හා ලෝක ළමා දින සුබ පැතුම් සඳහා පුවත්පත් දැන්වීම් වෙනුවෙන් රු.2,079,257 ක් ගෙවා පෞද්ගලික මාධ්‍ය ආයතන මඟින් සිදුකර ගෙන තිබුණි.

**3.6 කාර්යසාධනය**

-----------------

2015 වාර්ෂික අයවැය ඇස්තමේන්තුව හා ක්‍රියාකාරී සැලැස්ම අනුව අමාත්‍යාංශයේ ප්‍රගතිය පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

**(අ) ප්‍රධාන අරමුණුවලට අදාළ කාර්යවලින් බැහැරව ක්‍රියා කිරීම.**

-----------------------------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) ළමා හා කාන්තා අයිතිවාසිකම් සුරක්ෂිත කිරීම සඳහා යහපාලන භාවිතාවන් තහවුරු වන පරිදි අදාළ අවශ්‍යතා සම්පාදනය කිරීම සහ ප්‍රතිපත්ති සකස් කිරීම, ක්‍රියාත්මක කිරීම හා

නියාමනය කිරීම අමාත්‍යාංශයේ මෙහෙවර වුවද, ළමා හා කාන්තා අයිතිවාසිකම් තහවුරු කිරීම, ආරක්ෂා කිරීම, ප්‍රවර්ධනය කිරීම සඳහා සම්පාදනය කළ නීති හා සකස් කළ ප්‍රතිපත්ති බලාත්මක කර ක්‍රියාත්මක කිරීමක් සිදුකර නොතිබුණි.

(ii) ජාත්‍යන්තර කාන්තා දින ජාතික උත්සව සැමරීම, ප්‍රාදේශීය ලේකම් කාර්යාල මඟින් දැනුවත් කිරීමේ වැඩසටහන්, මාධ්‍ය වැඩසටහන්, කාන්තා දිනය සඳහා කොඩි නිර්මාණය, කාන්තා කාර්යාංශය විසින් කාන්තා දිනය සැමරීම සහ ජාත්‍යන්තර කාන්තා දිනයේ ප්‍රධාන උත්සවය පැවැත්වීම යන කරුණු යටතේ එකතුව රු.මිලියන 15.87 ක ප්‍රතිපාදන සලසා තිබූ අතර ඉන් රු.මිලියන 11.148 ක් අනුරාධපුරය, කිලිනොච්චිය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල උත්සව පැවැත්වීමට වැය කර තිබුණි. එම මුදල් කාන්තාවන් මුහුණ පාන බරපතල සමාජීය හා ආර්ථික ගැටළු නිරාකරණය කර ගැනීම සඳහා තිරසාර ක්‍රමෝපායන් හඳුන්වාදී ක්‍රියාත්මක කිරීම සඳහා වැය කළ හැකිව තිබුණි. තවද ජාත්‍යන්තර කාන්තා දින නිල උත්සවය අනුරාධපුර පැවැත්වීම සඳහා සැලසුම් කළ තිබුණද, ඒ සඳහා සහභාගී වන ප්‍රමාණය හා උත්සව භූමිය, කුටි, වේදිකා සකස් කළ යුතු ආකාරය පිළිබඳ නිසි පරිදි සැලසුම් නොකිරීම හේතුවෙන් ගිවිසගත් මිල ගණන් ඉක්මවා රු.771,890 ක් වැය කර තිබුණි. එමෙන්ම ආහාර පාන සඳහා රු.736,685 ක්ද ගෙවා තිබුණි.

(ආ) **ප්‍රමාණවත් ලෙස ඉටු නොකළ ප්‍රධාන කාර්යයන්.**

----------------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) ළමා කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය, ළමා සවිය වැඩසටහන සඳහා රු.මිලියන 15 ක ප්‍රතිපාදන සලසා තිබූ නමුත් ඒ සඳහා රු.මිලියන 16.6 ක් වැය කර තිබුණි. ලෝක ළමා දින උත්සවය සඳහා රු.මිලියන 7.2 ක් වැය කර තිබුණු අතර ඉන් රුපියල් මිලියන 6.17 ක් උත්සව සංවිධානය, පුවත්පත් දැන්වීම් පළකිරීම, නෘත්‍ය කණ්ඩායම් සහ වෙනත් විවිධ වියදම් සඳහා පෞද්ගලික ආයතනයකට ගෙවා තිබුණි. ළමුන්ට ත්‍යාග ලබාදීම සඳහා රු.මිලියන 0.61 ක් පමණක් වැය තිබුණි.

(ii) කාන්තා හිංසනය හා ළමා අපයෝජනයන්ගෙන් නිදහස් සමාජයක් ඇති කරලීම අමාත්‍යාංශයෙන් අපේක්ෂා කරන ප්‍රතිඵලය වී තිබුණත්, 2015 වර්ෂයේදී පුවත්පත්වලින් පමණක් හෙළි කර තිබූ ළමයින් හා කාන්තාවන් මුහුණුදී තිබූ කාන්තා හිංසන හා ළමා අපයෝජන සිද්ධීන් සංඛ්‍යාව 818 ක් විගණනයට අනාවරණය විය. එම සිද්ධීන් සම්බන්ධයෙන් අමාත්‍යාංශය කිසිදු පියවරක් ගෙන නොතිබුණි.

(ඇ) **ස්ත්‍රීන්ට සහ ගැහැණු ළමුන්ට සිදුවන සියලු ආකාරයේ ප්‍රචණ්ඩතාවයන් වැළැක්වීම සහ මුලිනුපුටා දැමීම**

------------------------------------------------------------------------------------------------

උක්ත තේමාව යටතේ ළමා හා කාන්තා සංවර්ධන කේන්ද්‍ර සහකාර නිලධාරීන් 37දෙනෙකු, අමාත්‍යාංශ 37කට අනුයුක්ත කර එම අමාත්‍යාංශවල සේවයේ නියුතු නිලධාරීන්, කාන්තාවන් හා දරුවන්ට සිදුවන අපයෝජනයන්, හිංසනයන් හා ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳව සංවේදී කිරීමට වැඩසටහන් 100ක් පවත්වා ප්‍රතිලාභීන් 10,000ක් දැනුවත් කිරීම සඳහා රු.මිලියන 4 ක ප්‍රතිපාදන සලසා තිබුණි. නමුත් කිසිදු කටයුත්තක් සිදුකර නොතිබූ අතර අමාත්‍යාංශය විසින් මෙම නිලධාරීන් සඳහා 2015 වර්ෂයේ වැටුප් හා දීමනා වශයෙන් රු.24,140,162 ක් ගෙවා තිබුණි. එසේ අනුයුක්ත කළ නිලධාරීන් 31 දෙනෙකු 2016 අප්‍රේල් මාසය වන විට වෙනත්

දෙපාර්තමේන්තුවලට මාරුවීම් ලබා හා වෙනත් රැකියාවන් ලැබී ඉවත්වී තිබුණි. එම නිලධාරීන්ගෙන් හා එම අමාත්‍යාංශවල දැනට ඉතිරිව සිටින නිලධාරීන් 06 දෙනාට පැවරූ කාර්යයන් ඉටු කර නොතිබුණු අතර අමාත්‍යාංශය හා එම නිලධාරීන් අතර මනා සම්බන්ධීකරණයක්ද නොතිබුණි.

**(ඈ) සුභසාධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම**

-------------------------------------------

ගැබිණි මව්වරුන්ට පෝෂණ මල්ල වැඩසටහන සඳහා රු.මිලියන 2,500 ක්ද, කිරි විදුරුව වැඩසටහන සඳහා රු.මිලියන 260 ක්ද, වශයෙන් සුභසාධන වැය විෂයය සඳහා රු.මිලියන 2,760 ක ප්‍රතිපාදන අමාත්‍යාංශය වෙත සලසා දී තිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) **ගැබිණි මව්වරුන්ට පෝෂණ මල්ලක් ලබාදීමේ වැඩසටහන**

---------------------------------------------------------------------

පෝෂණ මල්ල වැඩසටහන සඳහා සලසා තිබූ රු.මිලියන 2,500 ක ප්‍රතිපාදනවලට අමතරව රු.මිලියන 500 ක අතිරේක ප්‍රතිපාදන ලබාගෙන තිබුණි. ඉන් රු.මිලියන 2,422 ක් පමණක් වැය කර තිබුණි. පෝෂණ මල්ල වැඩසටහන ආරම්භ කිරීමේ උත්සව 04 ක් පැවැත්වීම සඳහා රු.මිලියන 7.00 ක්ද, පුවත්පත් දැන්වීම් පළකිරීම සඳහා රු.මිලියන 1.93 ක්ද ආරාධනා පත් හා පෝස්ටර් සඳහා රු.මිලියන 0.41 ක් ද, වැය කර තිබුණි.

(ii) **කිරි විදුරුව වැඩසටහන**

-------------------------

කිරි විදුරුව වැඩසටහන සඳහා වූ රු.මිලියන 260 ක ප්‍රතිපාදන සලසා තිබුණත්, ඉන් රු.මිලියන 39.39 ක් වෙනත් වැය විෂයයන්ට මාරුකර තිබුණි. රු.මිලියන 31.78 ක් ඉතිරිව තිබූ අතර රු.මිලියන 188.82 ක් මේ සඳහා වැයකර තිබුණි. අවුරුදු 2කට වැඩි දරුවන්ගේ පෝෂණ මට්ටම ඉහළ නැංවීමට පෝෂ්‍යදායි වැඩිහිටි ආහාර වලට ප්‍රමුඛත්වය ලබා දිය යුතු බවත් කිරි මිලි ලීටර් 100 ක මිලි ග්‍රෑම් 87.5 ක් ජලය බව මාතෘ හා ළමා සෞඛ්‍ය අධ්‍යක්ෂක විසින් පෙන්වා දී තිබූ අතර මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීමේදීද ප්‍රායෝගික ගැටළු රැසකට මුහුණ පෑමට සිදුවී තිබූ නිසාත් අපේක්ෂිත පෝෂණ මට්ටම් ඉහළ නැංවීමක් සිදුවී නොතිබුණි. එසේ වුවද 2016 වර්ෂයේදී තවදුරටත් මෙම වැඩසටහන ක්‍රියාත්මක කර තිබුණි.

**(iii) චක්‍රිය ණය වැඩසටහන**

--------------------------

ශ්‍රී ලංකා කාන්තා කාර්යාංශය මඟින් 1990 වර්ෂයේ සිට 2013 වර්ෂය දක්වා රු.මිලියන 93 ක් ලබාදෙමින් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 304 ක ක්‍රියාත්මක කර තිබූ චක්‍රීය ණය වැඩසටහන සම්බන්ධයෙන් කොට්ඨාශ 151 ක විස්තර පමණක් විගණනයට ලබා දී තිබුණි. එම කොට්ඨාශවලට ලබා දී තිබූ රු.මිලියන 43.307 ක් වෙනුවෙන් 2015 දෙසැම්බර් 31 දිනට එම ගිණුම්වල රු.මිලියන 46.96 ක් තිබුණි. මෙපමණ ශේෂයක් පැවතිමෙන් මෙම වැඩසටහන චක්‍රිය ණය වැඩසටහනක් ලෙස ක්‍රියාත්මකවී නොමැති බවත් කොට්ඨාශ 06 ක වැඩසටහන ක්‍රියාත්මක නොවන බවත් ප්‍රාදේශීය කාර්යාල 7 කට ලබාදී තිබූ ප්‍රතිපාදනවල එකතුව වූ රු.මිලියන 1.6 ක් එම කොට්ඨාශවලට ලැබී නොමැති බවත් ඉදිරිපත් කළ තොරතුරුවලින් නිරීක්ෂණය විය. කොට්ඨාශ 14 ක ණයකරුවන් 95දෙනෙකු විසින් රු.මිලියන 0.94 ක ගෙවීම් පැහැර හැර තිබුණි.

## 3.7 මතබේදයට තුඩුදෙන ගනුදෙනු

---------------------------------

අමාත්‍යාංශය විසින් සිදුකර තිබු මතභේදාත්මක ස්වරූපයේ ගනුදෙනුවක් නියැදි පරීක්ෂණවලදී අනාවරණය විය. විස්තර පහත දැක්වේ.

අම්පාර, ත්‍රිකුණාමලය හා උතුරු පළාතේ සේවා වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය සඳහා රු.මිලියන 170 ක ප්‍රතිපාදන සලසා තිබුණි. එම මුදල සම්පූර්ණයෙන්ම ඉතිරි වී තිබුණි. මේ සම්බන්ධයෙන් විමසීමේදී අමාත්‍යාංශ ලේකම් විසින් මෙම ව්‍යාපෘතිය අමාත්‍යාංශ විෂය පථයට අයත් කාර්යක් නොවන බවත් 2015 ජුනි.23 දිනැති අංක WA/04/02/01/2015 දරන ලිපිය මඟින් අධ්‍යක්ෂ ජනරාල් විදේශ සම්පත් දෙපාර්තමේන්තුව වෙතින් ඊට උපදෙස් ඉල්ලා තිබු නමුත් පිළිතුරු ලබාදී නොමැති බවත් දන්වන ලදි.

## 3.8 අවිධිමත් ගනුදෙනු

---------------------

අමාත්‍යාංශය විසින් එළඹ තිබුණු සමහර ගනුදෙනු විධිමත් බවින් තොර විය. නිරීක්ෂණය වූ එවැනි අවස්ථාවක් පහත දැක්වේ.

**රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ක්‍රියාපටිපාටියෙන් බැහැර වීම**

---------------------------------------------------------------------

ළමා සංවර්ධන හා කාන්තා කටයුතු අමාත්‍යාංශය විසින් කොන්ත්‍රාත්තු ලේඛනයක් පවත්වා නොතිබු අතර සෙත්සිරිපාය ගොඩනැගිල්ලේ අමාත්‍යාංශය ස්ථාපිත කිරීමේදී තුන්වන, හතරවන හා පස්වන මහල්වල අංශ වෙන්කිරීම (Partition) කාපට් කිරීමේ වැඩ සඳහා මිල ගණන් කැඳවීමකින් තොරව ගොඩනැගිලි දෙපාර්තමේන්තුවට කොන්ත්‍රාත්තුව භාරදී තිබුණි. ගොඩනැගිලි දෙපාර්තමේන්තුව සමඟ ගිවිසුමක් අත්සන් කර නොතිබු අතර රු.45,534,720 ක ඇස්තමේන්තුව සඳහා (BOQ) ප්‍රමාණ පත්‍රයක් ද ඉදිරිපත් කර නොතිබුණි. ගොනුවේ සඳහන් තොරතුරු අනුව වියදම්වල මුළු එකතුව රු.37,932,224 ක් වුවද, ගොඩනැගිලි දෙපාර්තමේන්තුව වෙත අවස්ථා 8 කදී එකතුව රු.52,926,670 ක් ගෙවා තිබුණි මේ අනුව ඇස්තමේන්තුව ඉක්මවා රු.14,994,446 ක් ගෙවා තිබුණි.

## 3.9 කළමනාකරණ දුර්වලතා

-----------------------------

නියැදි විගණන පරීක්ෂණවලදී පහත සඳහන් දුර්වලතා නිරීක්ෂණය විය.

(අ) කාන්තා හිංසනයන් පිළිබඳව, වතු අංශයේ ප්‍රතිලාභින් 5467 ක් දැනුවත් කිරීම සඳහා වැඩසටහන් ද ළමා මව්වරු බිහිවීම වැළැක්වීම සඳහා වැඩසටහන් ද පැවැත්වීමට සමාලෝචිත වර්ෂයේ දී රු.මිලියන 2.82 වැයකර තිබුණි. ළමා මව්වරුන් පිළිබඳවත්, සයිබර් අපරාධ, කාන්තා හිංසනය පිළිබඳව හා වතුකරයේ කාන්තාවන්ට සිදුවන හිංසනය යනුවෙන් පර්යේෂණ 03ක් සිදුකිරීම වෙනුවෙන් එකතුව රු.මිලියන 3.65 ක් පෞද්ගලික ආයතන 02 ක් වෙත ගෙවා තිබුණි. මෙම පර්යේෂණ සඳහා අවශ්‍ය දත්ත අමාත්‍යාංශයේ 1938 හා ළමාරක්ෂක අධිකාරියේ 1929 යන සේවාවලින්ද අමාත්‍යාංශ නිලධාරීන් වන වනිතා සංවර්ධන නිලධාරීන්, ළමා හිමිකම් ප්‍රවර්ධන නිලධාරීන් හා පරිවාස නිලධාරීන් හා අනෙකුත් රාජ්‍ය ආයතනවල නිලධාරීන්ගෙන්ද ලබාගෙන තිබුණි. එමෙන්ම තොරතුරු ලබා ගැනීමට දුෂ්කර අවස්ථාවලදී විකල්ප ක්‍රමවේදයන් යොදාගත් බවද, රාජ්‍ය ආයතනවලින් ලබාගත යුතු තොරතුරු අමාත්‍යාංශය මැදිහත්වී ලබාදී තිබුණි. ගිවිසුම් පරිදි මෙම පර්යේෂණ වාර්තා නියමිත දිනට ඉදිරිපත් කිරීමට අපොහොසත් වුවහොත් එකඟ වූ මුදලින් යම් ප්‍රමාණයක් අඩුකරන බව දෙපාර්ශවය අතර ඇති කර ගත් ගිවිසුමේ සඳහන් වුවද, එය ගණනය කරන ආකාරය පිළිබඳව තොරතුරු සඳහන් කර නොතිබුණි. එසේ තිබියදී පර්යේෂණ වාර්තා ඉදිරිපත් කිරීමට නියමිත දිනට මාසයකට පසුව වාර්තා ඉදිරිපත් කර තිබුණි. මෙම

පර්යේෂණ වාර්තා පරීක්ෂා කිරීමේ කටයුතු සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් සිදුකරමින් පැවැතුණු අතර එම වාර්තාවල නිර්දේශයන් ක්‍රියාත්මක කිරීම පිළිබඳවද 2015 දෙසැම්බර් 31 දින වන විටත් සලකා බලා නොතිබුණි.

(ආ) 2015 ජුනි 10 දින අමාත්‍යාංශය සතු වාහනයකට සිදුවූ අනතුර සම්බන්ධයෙන් රු.5,069,907 ක හානියක් සිදුවී තිබුණි. අනතුර සිදු වී 2016 ජූලි 12 දිනට වර්ෂයක් ඉක්මවා තිබුණත් රක්ෂණ වන්දි ගෙවීමට රක්ෂණ ආයතනය එකඟවී නොතිබු අතර මුදල් රෙගුලාසි 104(4) යටතේ අලාභයන් පිළිබඳ අවසාන වාර්තාව ඉදිරිපත් කර තිබු නමුත් එහි වගකිව යුතු නිලධාරීන්ගෙන් අයකර ගැනීමට තීරණය කළ මුදල හා රක්ෂණය කරන ලද මුදල් ප්‍රමාණය හා අයකරගත හැකි මුදල් ප්‍රමාණය දක්වා නොතිබුණි.

**3.11 මානව සම්පත් කළමනාකරණය**

**අනුමත සේවක සංඛ්‍යා හා තථ්‍ය සේවක සංඛ්‍යා**

2015 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 29 | 25 | 04 |
| (ii) | තෘතියික මට්ටම | 17 | 11 | 06 |
| (iii) | ද්විතියික මට්ටම | 1,435 | 1,097 | 338 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 79 | 69 | 10 |
| | එකතුව | 1,560 | 1,202 | 358 |

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට අනුයුක්ත කරනු ලබන වනිතා සංවර්ධන නිලධාරීන් හා උපදේශන සහකාර නිලධාරී පුරප්පාඩු 338 ක් ලෙස දැක්වුවද, දැනට සේවයේ නියුතු නිලධාරීන් 1097 ක් විසින් සිදුකරනු ලබන කාර්යයන් සම්බන්ධයෙන් දිස්ත්‍රික් නිලධාරි මඟින් මාසික ප්‍රගති වාර්තා නිසි පරිදි අමාත්‍යාංශයට ගෙන්වාගෙන පසුවිපරම් හා අධීක්ෂණයන් සිදුකර නොමැති බවත්, එවා තිබු ප්‍රගති වාර්තාවන්ද ප්‍රමාණවත් කරුණු දැක්වීම් සිදුකර නොමැති බවත් නිරීක්ෂණය විය.

(ආ) අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ මට්ටමේ නිලධාරීන් 04 ක් සහ තෘතියික මට්ටමේ නිලධාරීන් 06 දෙනෙකුගේ පුරප්පාඩු පැවතීම නිසා ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් සිදුකරනු ලබන අමාත්‍යාංශ කාර්යයන්, පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව, ජාතික ළමා ආරක්ෂක අධිකාරිය, ළමා සංවර්ධන අරමුදල, ළමා ලේකම් කාර්යාලය, කාන්තා කාර්යාංශය, කාන්තා කමිටුව, සංවර්ධන අංශය ආදියේ කටයුතු සම්බන්ධයෙන් සැලසුම්කරණය හා අධීක්ෂණ කටයුතු නිසි පරිදි සිදුකිරීමට නොහැකි වී ඇති බව නිරීක්ෂණය විය.